# ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් සඳහා ජීවිත රක්ෂණය පිළිබඳ ජාතික රචනා තරඟය

**තරුණ සිත් පුබුදමු. හෙට දවස සුරක්ෂිත කරමු.**

ජීවිත රක්ෂණය තුළින් මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)
ලොව පුරා ජීවිත සහ රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා වන පදනම (FALIA), ජපානය
ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL) යන ආයතනවල ඒකාබද්ධ මුලපිරීමකි.

## තරඟය පිළිබඳව

ජීවිත රක්ෂණය පිළිබඳ ජාතික රචනා තරඟය යනු ජීවිත රක්ෂණයේ සහ මූල්‍ය සැලසුම්කරණයේ ඇති වැදගත්කම වටහා ගැනීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීම සහ ඔවුන් පෙළඹවීම වෙනුවෙන් රට පුරා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සාක්ෂරතාව ඉහළ නංවන මුලපිරීමකි.

මෙම තරඟයේ අරමුණ වන්නේ සිසුන්ගේ රචනාකරණ, විශ්ලේෂනාත්මක සහ සන්නිවේදන කුසලතා වර්ධනය කරන අතරම මූල්‍ය සුරක්ෂිතතාව, පවුලේ ආරක්ෂාව, දිගුකාලීන සැලසුම්කරණය, අවදානම් කළමණාකරණය සහ වගකීම් සහගත තීරණ ගැනීම පිළිබඳව තාර්කිකව සිතීමට ඔවුන්ව දිරිගැන්වීමයි.

මෙම සුවිශේෂී ජාතික වැඩසටහන සඳහා සහභාගී වන ලෙස ශ්‍රී ලංකාව පුරා සිටින පාසල් සිසුන්ට ආරාධනා කෙරේ.

## අරමුණු

- පාසල් සිසුන් අතර මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම.
- ජීවිත රක්ෂණ සංකල්පය පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය වර්ධනය කිරීම.
- තාර්කික සහ නිර්මාණශීලී චින්තනය දිරිමත් කිරීම.
- කුඩා අවදියේ සිටම වගකීම් සහගත මූල්‍ය සැලසුම්කරණය ප්‍රවර්ධනය කිරීම.
- මූල්‍යමය වශයෙන් වගකීම් සහගත අනාගත පුරවැසියන් වීමට සිසුන් පෙළඹවීම.

## සහභාගි විය හැක්කේ කාටද?

මෙම තරඟය පහත සඳහන් පාසල්වල සිසුන් සඳහා විවෘත වේ:

| | | |
|---|---|---|
| රජයේ පාසල් | පෞද්ගලික | ජාත්‍යන්තර පාසල් |

## Age Categories

| | |
|---|---|
| කනිෂ්ඨ අංශය: වයස අවුරුදු 13–16 | 2010 ජනවාරි පළමු (01) වන දින සිට 2013 දෙසැම්බර් තිස් එක් (31) වන දා දක්වා උපත ලැබූ සිසුන් (2026 දෙසැම්බර් තිස් එක (31) දින වන විට වයස අවුරුදු 13 සිට 16 දක්වා) |
| ජ්‍යෙෂ්ඨ අංශය: වයස අවුරුදු 17–19 | 2007 ජනවාරි පළමු (01) වන දින සිට 2009 දෙසැම්බර් තිස් එක් (31) වන දා දක්වා උපත ලැබූ සිසුන් (2026 දෙසැම්බර් තිස් එක (31) දින වන විට වයස අවුරුදු 17 සිට 19 දක්වා) |

## භාෂාවන්

පහත සඳහන් එක් භාෂාවකින් පමණක් රචනය ලිවිය හැකිය:

| | | |
|---|---|---|
| සිංහල | දෙමළ | ඉංග්‍රීසි |

## තරඟ ආකෘතිය

තරඟය 2026 ඔක්තෝබර් මස, ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක 25 පුරා පිහිටුවා ඇති නම් කරන ලද විභාග මධ්‍යස්ථානවලදී අධීක්ෂණය යටතේ පවත්වනු ලබන විභාගයක් ලෙස පැවැත්වේ.

තරඟය පවත්වන දිනයේදී ලබා දෙනු ලබන ප්‍රශ්න තුන අතරින් තමන් කැමති එක් රචනා ප්‍රශ්නයකට පමණක් එක් එක් සහභාගිවන්නා විසින් පිළිතුරු සැපයිය යුතුය.

- කාලය: පැය 1යි මිනිත්තු 30කි (උපරිම)
- සහභාගීත්වය: නොමිලේ

රචනය තුළින් අපේක්ෂිත කරුණු:

- ජීවිත රක්ෂණ සංකල්ප පිළිබඳ අවබෝධය
- දැනුම උපයෝජනය කිරීමට සහ විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව
- අදහස් ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම

ලියාපදිංචි වීමේදී / අයදුම් කිරීමේදී ලබා දී ඇති ඔබව සම්බන්ධ කරගත හැකි තොරතුරු භාවිතා කරමින් 2026 **ඔක්තෝබර් මස පළමු සති දෙක තුළ** අයදුම්කරුවන් වෙත ඔවුන්ගේ විභාග දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ විස්තර කෙටි පණිවුඩ සහ/හෝ විද්‍යුත් තැපැල හරහා ලැබෙනු ඇත.

එබැවින්, ලබා දී ඇති ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය නිවැරදි හා ක්‍රියාකාරී බව සහතික කර ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

## සූදානම් වීම සඳහා වන ආදර්ශ මාතෘකා

රචනා තරඟයට පෙර සූදානමක් ලෙස පහත සඳහන් කරුණුවලට අදාළව ජීවිත රක්ෂණය පිළිබඳව අධ්‍යයනය කිරීමට සිසුන් උනන්දු කරවනු ලැබේ:

ජීවිත රක්ෂණය ;

- පවුලේ මූල්‍ය ආරක්ෂාව සඳහා මෙවලමක්
- මූල්‍ය ආරක්ෂාව සැපයීමේ මාධ්‍යයක්
- ආදායම් ප්‍රතිස්ථාපනය සඳහා සහායක්
- දිගුකාලීන ඉතිරිකිරීමේ ක්‍රමයක්
- අනාගත සැලසුම් කිරීම සඳහා ආයෝජනයක්
- අවදානම් කළමනාකරණ විසඳුමක්
- ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීමේ ක්‍රමයක්
- ජීවිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පදනමක්
- අනපේක්ෂිත සිදුවීම් වලට එරෙහිව ආරක්ෂාවක්
- ගෘහස්ථ යහපැවැත්මට දායක වන්නෙකු වශයෙන්

## ලියාපදිංචිය

**ලියාපදිංචි වීමේ කාලසීමාව**

**2026 ජූලි 15** දින සිට **2026** සැප්තැම්බර් 30 වන දින දක්වා

**ලියාපදිංචිවීම සිදුකල කළ යුත්තේ ශිෂ්‍යයාගේ දෙමව්පියන් හෝ නීත්‍යානුකූල භාරකරු විසින් පමණි.**

## වැදගත් දිනයන්

| ක්‍රියාකාරකම | දිනය |
|---|---|
| ලියාපදිංචිය ආරම්භ කිරීම | 2026 ජූලි 15 |
| ලියාපදිංචිය අවසන් කිරීම | 2026 සැප්තැම්බර් 30 |
| රචනා තරඟය පැවැත්වීම | 2026 ඔක්තෝබර් |
| රචනා ඇගයීම | 2026 ඔක්තෝබර් - නොවැම්බර් |
| ජාතික සම්මාන උළෙල පැවැත්වීම | 2026 නොවැම්බර්/දෙසැම්බර් |

**ලියාපදිංචි වීමට පෙර කරුණාකර ඔබ විසින් පහත කරුණු සම්පූර්ණ කර ඇති බවට වග බලා ගන්න:**

- ලියාපදිංචි වීම සඳහා උපදෙස් හොඳින් කියවන්න
- ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ පාසල පිළිබඳ තොරතුරු සූදානම් කර තබාගන්න.
- දෙමාපියන්ගේ/භාරකරුගේ දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ අනෙකුත් සම්බන්ධ කරගත හැකි තොරතුරු සූදානම් කර තබාගන්න.
- විභාගයට පෙනී සිටීමට කැමති දිස්ත්‍රික්කය ඉතා සැලකිලිමත්ව තෝරාගන්න.
- සක්‍රීය විද්‍යුත් තැපැල් ලිපිනයක් සහ ජංගම දුරකථන අංකයක් භාවිත කරන්න.

**රචනා ඇගයීමේ නිර්ණායක**

විනිවිදභාවයෙන් යුතු අපක්ෂපාතී ඇගයීම් ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා ප්‍රමිතිගත තක්සේරු නිර්ණායක භාවිතා කරමින් ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් විසින් සියලුම රචනා ඇගයීමට ලක් කරනු ලැබේ.

**ඇගයීම පදනම් වන්නේ:**

- **ලබා දී ඇති මාතෘකාවට ඇති අදාළත්වය**
- **අන්තර්ගතයේ ගුණාත්මකභාවය සහ නිරවද්‍යතාවය**
- **රචනා ව්‍යුහය සහ සංවිධානය**
- **තර්කානුකූල චින්තනය**
- **භාෂා භාවිතය සහ ප්‍රකාශනයේ පැහැදිලි බව**

**ත්‍යාග**

## 🏆 🏆 මුදල් ත්‍යාග දිනා ගන්න

සියලුම ත්‍යාග 2026 නොවැම්බර්/දෙසැම්බර් මස කොළඹදී පැවැත්වෙන ජාතික මට්ටමේ ත්‍යාග උත්සවයකදී ප්‍රදානය කෙරේ.

**ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් (එක් එක් බාණ්ඩය – කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ):**

| 🏆 ස්ථානය | කනිෂ්ඨ බාණ්ඩය (අවුරුදු 13–16) | ජ්‍යෙෂ්ඨ බාණ්ඩය (අවුරුදු 17–19) |
|---|---|---|
| 🥇 ප්‍රථම ස්ථානය | රු. 100,000 සහ ටැබ්ලට් **පරිගණකයක්** | රු. 100,000 සහ ටැබ්ලට් **පරිගණකයක්** |
| 🥈 දෙවන ස්ථානය | රු. 75, 000 | රු. 75,000 |
| 🥉 තෙවන ස්ථානය | රු. 50,000 | රු. 50,000 |

## 🎖 දිස්ත්‍රික් කුසලතා සම්මාන ජයග්‍රාහකයන් (දිස්ත්‍රික්ක 25)

වයස් කාණ්ඩ දෙකම යටතේ සෑම දිස්ත්‍රික්කයකින්ම ඉහළම දක්ෂතා දක්වන සිසුන් වෙනුවෙන් දිස්ත්‍රික් කුසලතා සම්මාන පිරිනමනු ලැබේ.

දිස්ත්‍රික් කුසලතා සම්මාන ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් තෝරා ගැනීමෙන් අනතුරුවයි

කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ කාණ්ඩ යටතේ දිස්ත්‍රික් කුසලතා සම්මානලාභීන් 144 දෙනෙකු තෝරා ගනු ලැබේ. සෑම දිස්ත්‍රික් කුසලතා සම්මානලාභියෙකුටම රුපියල් 10,000 ක මුදල් ත්‍යාගයක් හිමිවේ.

## 🎓 සහතික පත්‍ර

සියලුම තරඟකරුවන් සඳහා සහතික පත් පිරිනැමේ

- ජාතික මට්ටමේ ජයග්‍රාහකයින්ට සහ දිස්ත්‍රික් කුසලතා සම්මානලාභීන්ට මුද්‍රිත සහතිකපත් පිරිනැමේ
- තරඟයට සහභාගී වීම වෙනුවෙන් සියලුම තරඟකරුවන්ට සහභාගීත්වය වෙනුවෙන් නිල විද්‍යුත් සහතිකයක් ලැබෙනු ඇත.

## තරඟ නීති

1. ලියාපදිංචි වූ ශිෂ්‍යයා විසින් ලියාපදිංචියේදී තෝරාගත් විභාග මධ්‍යස්ථානයේදී පමණක් තරඟ විභාගයට පෙනී සිටිය යුතුය.
2. ලියාපදිංචි වූ සෑම ශිෂ්‍යයෙකුගෙන්ම එක් රචනා පත්‍රයක් පමණක් පිළිගනු ලැබේ.
3. ජයග්‍රාහකයෙකු ලෙස තෝරාගනු ලැබුවහොත්, අනන්‍යතාවය, සුදුසුකම් සහ ලියාපදිංචි විස්තර තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපකාරක ලේඛන ඉදිරිපත් කරන ලෙස සංවිධායක මණ්ඩලය ඉල්ලා සිටිය හැක.
4. දැනුවත් කිරීමේ, අධ්‍යාපනික, වාර්තාකරණ හෝ වෙනත් ප්‍රකාශන කටයුතු සඳහා ලැබුණු රචනා සහ ඒවායේ අන්තර්ගතය ප්‍රකාශයට පත් කිරීමේ අයිතිය සංවිධායක මණ්ඩලය සතුය.
5. තරඟ නීති, සුදුසුකම් නිර්ණායක හෝ ලබාදී ඇති උපදෙස්වලට අනුකූල නොවන අයදුම්පත් හෝ රචනා ඉදිරිපත් කිරීම් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය සංවිධායක මණ්ඩලය සතුය.

## අමතන්න


**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

දුරකථන: 011 2396184-9

දිගු: 103 | 115 | 134

විද්‍යුත් ලිපිනය: mder@ircsl.gov.lk